# වේවැල්කැටිය ශිලා ලේඛනයෙන් හෙළිවන ගම්බද උසාවි ක්‍රමය හා බලතල බෙදීම පිළිබඳ අධ්‍යයනයක්

ඩී. එම්. එන්. ජී. කේ. දිසානායක
සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
geethikakumuduni0@gmail.com

**සාරසංක්ෂේපය**

අතීත ලංකාවේ සමාජ ආර්ථික දේශපාලන තොරතුරු විමර්ශනයේ දී සෙල්ලිපි අධ්‍යයනය මගින් ලබාගත හැකි දායකත්වය අතිමහත් ය. ක්‍රි.ව. 10 වන සියවසේ ලක්දිව පැවති පැරණි සමාජ ව්‍යූහය හා එහි ක්‍රියාත්මක වූ ගම්බද උසාවි ක්‍රමය හා බලතල පිළිබඳ වේවැල්කැටිය පුවරු ලිපිය ඇසුරින් සාකච්ඡා කිරීම මෙමගින් අපේක්ෂිත ය. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ ක්‍රි.ව. 10 වන සියවසේ පැවති ගම්බද උසාවි මගින් සමාජ ගැටලු විසඳීමෙහි ලා භාවිත කළ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේද හඳුනා ගැනීම යි. ඇතැම් විටෙක එවැනි පුරාණ ක්‍රම වර්තමානයට වුව ද ගළපා ගැනීමේ හැකියාව විමසා බැලිය හැකි ය. ඒ අනුව මෙම පර්යේෂණයට අදාළ ගැටලුව වනන්නේ ක්‍රි.ව. 10 වන සියවසට අයත් ගම්බද උසාවි ක්‍රමය හා පාලන බලතලවල ස්වභාවය කෙබඳු ද? යන්න විමසා බැලීම යි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යොදා ගනිමින් ශිලා ලේඛන විමර්ශන මූලාශ්‍රය ලෙස Epigraphia Zeylanica Volume 01 කෘතියේ එන වේවැල්කැටිය පුවරු ලිපියත්, අදාළ සෙසු ග්‍රන්ථත්, වීඩියෝ පට හා අන්තර්ජාල වෙබ් පරිශීලකයන් ද යොදා ගැනුණි. වේවැල්කැටිය සෙල්ලිපිය හතර වන මිහිඳු රජුගේ නවවන රාජ්‍ය වර්සයේ දී පිහිටුවන ලද අතර මෙම පුවරු ලිපිය ඓතිහාසික වශයෙන් වැදගත් වන්නේ එම සමාජ ව්‍යූහයන්හි ක්‍රියාත්මක වූ සමාජ පාලන ක්‍රම, නීති රීති හා දඬුවම් ක්‍රම පිළිබඳ ව තොරතුරු සංග්‍රහ කරන බැවිනි. එසේ ගම්බද උසාවි ආශ්‍රිත නීති රීති ක්‍රියාත්මක වීම මගින් තදීය සමාජයේ ගොඩ නැගෙන හර පද්ධති, සමාජ හරයන් හා සාමාජ ධර්මතාවන් ආරක්ෂා වී පවතින්නට ඇති බව සිතිය හැකි ය. මෙම පුවරු ලිපියට අනුව දඬුවම් ලැබිය හැකි වැරදි ක්‍රියා ලෙස නම් කර ඇත්තේ මනුෂ්‍ය ඝාතනය, සොරකම, ශාරීරික වද හිංසා පැමිණවීම, මීගවයින්, එළගවයින්, එළුවන් ආදි සත්ව ඝාතනයන් ය. මෙවැනි අපරාධ සඳහා සම්බන්ධ තැනත්තන්ට දෙනු ලැබූ දඬුවම් ක්‍රමය වූයේ මරණ දණ්ඩනය, අංගභානි කිරීම, දඩ ගෙවීම හා වස්තු රාජසන්තක කිරීම යනාදිය යි. නීති කඩකරන්නා වූ පාලක පක්ෂයට මෙන් ම පාලිත පක්ෂයට ද මෙම දඬුවම් ක්‍රමය වලංගු වූ බව ශිලා ලේඛනයේ සඳහන් ය. ඒ අනුව ක්‍රි.ව. 10 වන සියවසට අයත් වේවැල්කැටිය ශිලා ලේඛනයෙන් ප්‍රකට වන ගම්බද උසාවි ක්‍රමය හා බලතල කෙතෙක් දුරට ප්‍රජාතන්ත්‍රවාදී ද හා නූතන පාලන ක්‍රියාකාරකම්වලට දායක කොට ගත හැකි වන්නේ කෙසේ දැයි යන්න මෙම පර්යේෂණය ඔස්සේ අවබෝධ කොට ගත හැකි වේ.

**මුඛ්‍ය පදඃ** දඬුවම් ක්‍රම, නීතිය, පාලන බලතල, පැරණි සමාජ ක්‍රමය, වේවැල්කැටිය ශිලා ලිපිය

# A Study on Village Court System and Division of Powers as Revealed by the *Wewalkatiya* Stone Inscription

D. M. N. G. K Dissanayake
Department of Sinhala, University of Kelaniya
geethikakumuduni0@gmail.com

**Abstract**

The contribution of inscriptions in the investigation of social, economic, and political information of the past Sri Lanka is immense. It is expected to discuss the old social structure of Sri Lanka as far back as the 10th century and the village court system and powers that operated in it based on the information of the "Wewalkatiya" stone inscription. The primary objective of this study is to identify the democratic methods used in solving social problems by the village courts in the 10th century. Sometimes, it is possible to examine the possibility of adapting such ancient methods even to the present. Accordingly, the research problem of this study is to investigate the nature of the village court system of the 10th century and its governing powers. Subject to the qualitative research method, information on the "Wewalkatiya" stone inscription in Epigra Zelenice Volume 01, other related books, videos, and internet web users were used as the source of the inscriptions investigation. The "Wewalkatiya" stone inscription was established during the ninth reign of King Mihindu IV and this is of historical importance because it reveals information about the social control methods, rules, and punishments that were implemented in those social structures. Thus, it is possible to think that social values and morals may have been protected due to the value systems built up in these societies by the implementation of rules and regulations related to village courts. According to this inscription, the offences punishable are murder, theft, physical torture, and the killing of animals like cattle, cows, goats, etc. The punishments were the death penalty, mutilation, payment of fines, confiscation of property, etc. Also, the facts mentioned in the inscription reveal that this punishment system was valid for the ruling class as well as the controlled party who violated the above punishments. Accordingly, it is possible to understand how far the village court system and powers, which are known from the 10th century "Wewalkatiya" inscription, are democratic and can contribute to modern governance activities.

**Keywords:** Ancient Social System, Governing System, Punishment, Rules, Slab Inscriptions